**ශීර්ෂය 121 - රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

---

මෙම වාර්තාවේ 1 ඡේදයේ හා 2 ඡේදයෙහි ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1. අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු

| ශිර්ෂ | දෙපාර්තමේන්තුව |
|---|---|
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව |

## 1.1 විගණන විෂය පථය

ඉහත 1 ඡේදයේ සඳහන් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීට හා ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

| ශීර්ෂ | අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය |
|---|---|---|
| 121 | රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 2015.08.04 |
| 253 | විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 2015.07.20 |
| 254 | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 2015.07.14 |

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරීන්ගේ වගකීම**

විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 02 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 149,477 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 147,956 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 31 ක සිට රු.මිලියන 1,411 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.96 ක සිට සියයට 6.82 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 121 | 1,159 | 1,080 | 79 | 6.82 |
| 253 | 147,224 | 145,813 | 1,411 | 0.96 |
| 254 | 1,094 | 1,063 | 31 | 2.83 |
| **එකතුව** | **149,477** | **147,956** | **1,521** | |

## 2.2 ආදායම් ගිණුම්

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම්**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු 02 ක් විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේත 05 ක් සඳහා එකතුව රු.මිලියන 20,338.28 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 16,203.41 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 78.01 ක සිට සියයට 135.7 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම/ (ඌනතාවය) |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 10.03.07.99 | 118.28 | 160.51 | 42.23 | 35.70 |
| 20.04.02.00 | 7,000.00 | 5,557.25 | (1,442.75) | (20.61) |
| 20.04.01.00 | 12,000.00 | 9,361.64 | ( 2,638.36) | (21.99) |
| 10.03.08.00 | 20.00 | 17.59 | (2.41) | (12.05) |
| 10.03.07.02 | 1,200.00 | 1,106.42 | (93.58) | (07.80) |
| **එකතුව** | **20,338.28** | **16,203.41** | **(4,134.87)** | |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 02 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 12101 | 31.0 | 24.1 | 15.5 | 15.9 | 110.0 | 74.1 |
| 25301 | 32.0 | 32.0 | 17.0 | 20.81 | 125.0 | 97.5 |
| 25401 | 65.0 | 42.1 | 39.0 | 40.67 | 220.0 | 159.3 |

## 2.4 අග්‍රිම ගිණුම

අමාත්‍යාංශය යටතේ වන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ගිණුමේ ශේෂය රු.මිලියන 33.31 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම්

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ වන දෙපාර්තමේන්තු 02 ක 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.මිලියන 12.81 ක් විය. විස්තර පහත දැක්වේ

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|---|
| | | රු.මිලියන |
| රාජ්‍ය පරිපාලන හා ස්වදේශිය කටයුතු අමාත්‍යාංශය | 6000/0000/000/0015/0034/000 | 4.05 |
| විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0133/000 | 8.50 |
| රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 6000/0000/000/0015/0134/000 | 0.26 |
| **එකතුව** | | **12.81** |

## 2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සිට 5 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

## 3. ශීර්ෂය 121 - රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය

### 3.1 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 04 දිනැති අංක 05/2013 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය ප්‍රකාරව 2014 වර්ෂය සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුව පදනම් කරගෙන අවශ්‍ය අග්‍රිම සීමාවන් දක්වා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. එම සීමාවන් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අනුමත කර තිබුණි. අනුමත කළ සීමාවන් අනුව ඒ ඒ මාසවලදී අපේක්ෂා කළ පරිදි අග්‍රිම අමාත්‍යාංශය වෙත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර නොතිබුණි. මේනිසා වැය විෂයයන් 4 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයන් උපයෝජනය කිරීම සඳහා අග්‍රිම නොලැබීම නිසා එකතුව රු. 25,903,800 ක් හෙවත් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 0.83 ක සිට සියයට 49.44 ක ප්‍රමාණයක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ආ) වැය විෂයයන් 05 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.2,630,000 ක ප්‍රතිපාදන මුළුමණින්ම ඉතිරිවී තිබුණි.

## 3.2 අග්‍රිම ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුදල් රෙගුලාසි 371 හි සඳහන් විධිවිධානයන්ට පටහැනිව මාණ්ඩලික නොවන නිලධාරීන් 05 දෙනෙකු වෙත අවස්ථා 12 කදී එකතුව රු.132,610 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 20 කට අදාලව ලබා දී තිබුණු එකතුව රු.377,000 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම කාර්යය නිමවී මාස 01 ක සිට මාස 02 ක් දක්වා කාල පරාසයක ප්‍රමාදයකින් පසුව එම අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ඇ) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු.20,000 ක් වුවත්, එම රෙගුලාසියට පටහැනිව අවස්ථා 07 කදී නිලධාරීන් 04 දෙනෙකු වෙත රු.20,000 ක් ඉක්මවූ එකතුව රු.167,485 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

## 3.3 පොදු තැන්පත් ගිණුම

අමාත්‍යාංශය විසින් වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.99,205 ක්වූ තැන්පතු 12 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.4 ආදායම් ගිණුම්

අමාත්‍යාංශ ලේකම්වරයා වෙත ආදායම් සංකේතයක, ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) **10.03.07.99 දරන බලපත්‍ර ගාස්තු - අනෙකුත්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට අදාලව රු.මිලියන 118 ක ආදායම් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.මිලියන 160.5 ක ආදායම් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 136 ක් වී තිබුණි.

(ii) ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල 05 ක් විසින් උපයන ලද ආදායම් අඩු වී තිබුණු අතර ඉන් වවුනියාව, මන්නාරම, හම්බන්තොට සහ ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ආදායම් අඩු වීම පිළිවෙලින් සියයට 31 ක සිට සියයට 81 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.5 බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.1,021,271 ක් වී තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

(අ) **නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| • මුදල් රෙගුලාසි 625 (1) | 11,401,730 | G-LED ව්‍යාපෘතියේ 2013/2014 වර්ෂ වෙනුවෙන් මිලදී ගෙන තිබුණු එකතුව රු.11,401,730 ක් වටිනා ස්ථාවර වත්කම් ඉන්වෙන්ට්‍රි ලේඛනයක හෝ රෙජිස්ටරයක ඇතුළත් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| • මුදල් රෙගුලාසි1646 | 11,401,730 | • G-LED ව්‍යාපෘතියේ වත්කම් සම්බන්ධයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.<br>• අමාත්‍යාංශය සතු වාහන 64 කින් සංචිත වාහන 27 කට අදාල සියලුම දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.<br>• තවත් සංචිත වාහන 05 කට අදාලව මාස 05 ක සිට මාස 12 ක් දක්වා වූ කාලපරාසයක දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| **(ii) ජනාධිපති ලේකම් කාර්යාලයේ චක්‍රලේඛ**<br>--------------------------<br>2010 මැයි 14 දිනැති චක්‍රලේඛ අංක CA/1/171 දරන චක්‍රලේඛයේ 3.1ඡේදය | | චක්‍රලේඛ ප්‍රකාරව වෙන්කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03 ක් වුවත් ඊට පටහැනිව රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු භාර ගරු අමාත්‍යවරයාගේ පරිහරණය වෙනුවෙන් නිල වාහන 05ක් අනුයුක්ත කර තිබුණි. |
| **(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**<br>------------------------------<br>1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන චක්‍රලේඛයේ 02 සහ 03 ඡේදයන් | - | අමාත්‍යාංශය සතු සංචිත වාහන 07 ක රාජ්‍ය ලාංඡනය සහ ආයතනයේ නම යොදා නොතිබුණි |

**(iv) ජාතික අයවැය චක්‍රලේඛ**

-------------------------

| | |
|---|---|
| 2014 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයේදී ස්ථාන මාරු වී පැමිණි නිලධාරින් දෙදෙනෙකු ගෙන් පවරා ගන්නා ලද ණය ශේෂ චක්‍රලේඛයේ සඳහන් කාල සීමාව ඉක්මවා තිබුණද, එම ණය ශේෂ අයකර ගැනිමට කාර්යාලය අපොහොසත් වි තිබුණි. |

**(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම**

-----------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවන අන්දමින් ක්‍රියා කළ අවස්ථා පහත දැක්වේ.

(i) ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත නිදහස් කරන ලද අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) විසින්, යහපාලනය සඳහා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය පිළිබඳ (G-LED) ව්‍යාපෘතිය වෙනුවෙන් මෝටර් රථයක් මිලදී ගැනීම සඳහා, පෞද්ගලික සමාගමක් වෙත රු.8,325,000 ක් (Direct Payment) සෘජු ගෙවීමක් ලෙස ගෙවා තිබුණි.

(ii) එක්සත් ජාතීන්ගේ සංවර්ධන අරමුදල (UNDP) විසින් රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය වෙනුවෙන් කරනු ලැබූ ඉහත මිලදි ගැනිමට අදාල වූ එකතුව රු.2,317,321 ක දේශීය බදු මුදල්, රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින් ගෙවිය යුතුව තිබුණි.

**3.7 විදේශාධාර ව්‍යාපෘති**

------------------------

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුල්‍යාණය යටතේ එක් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘති ගිවිසුම අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.25,000,000 ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘතිය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු. 24,464,785 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යහපාලනය සඳහා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය පිළිබඳ (G-LED) ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන කාලය මාස 53 ක් වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ගත වූ මාස 17 ක කාලය තුළ ව්‍යාපෘතියේ කාලසීමාවෙන් සියයට 32 ක් ආවරණය කර තිබුණි. එම කාල සීමාව වෙනුවෙන් ව්‍යාපෘතියේ තථ්‍ය පිරිවැයෙන් සියයට 1.93 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) යහපාලනය සඳහා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය පිළිබඳ (G-LED) ව්‍යාපෘතියේ කළමනාකරණ ඒකක නිලධාරීන් වෙනුවෙන් වැටුප් ගෙවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2015 මාර්තු 12 දින ලැබී තිබුණි. අදාල අනුමැතිය ලැබීමට පෙර එම නිලධාරීන් වෙත රු.2,701,762 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

(ඇ) යහපාලනය සඳහා ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය පිළිබඳ (G-LED) ව්‍යාපෘති කළමනාකරණ ඒකක නිලධාරීන් වෙනුවෙන් අනුමත නොකරන ලද තනතුරු 03ක් සහ අනුමත තනතුර සංඛ්‍යාව ඉක්මවූ තනතුරු 04 ක් වෙනුවෙන් එකතුව රු.158,601 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

**3.8 දේශීය මූල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

---

ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් පිළිබඳව නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(i) 2006 වර්ෂයේදී නිවාස 1452 කින් යුතු නිවාස සංකීර්ණයක් ඉදිකිරීම සඳහා කැප්පෙටිපොල මාවත - යෝජිත නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය අරඹා තිබුණි. 2010 හා 2011 වර්ෂ දෙක තුළ නාගරික සංවර්ධන අධිකාරිය, මධ්‍යම ඉංජිනේරුමය කටයුතු පිළිබඳ උපදේශක කාර්යාංශය සහ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව යන ආයතන වෙත රු.5,019,262 ක් ගෙවා තිබුණි. කෙසේ නමුත් එම ව්‍යාපෘතියේ කටයුතු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිම කර නොතිබුණි.

(ii) මහනුවර කුණ්ඩසාලේ නිවාස 696 ක් ඉදිකිරීම සඳහා රු.2,728,828,261 ක ඇස්තමේන්තුගත පිරිවැයක් සහිතව 2010 අගෝස්තු මාසයේදී ව්‍යාපෘතිය ආරම්භ කර තිබුණි. 2015 ජුලි 15 දින වන විට එම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි.

**3.9 කාර්යසාධනය**

**---------------**

2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන E- Citizen වැඩසටහන යටතේ 2013 හා 2014 වර්ෂ සඳහා වූ ඉලක්කගත වැඩසටහන් සම්බන්ධව 2015 ජනවාරි 30 දිනට වූ ප්‍රගතිය පිළිබඳ වාර්තාවක් 2015 ජූලි 15 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකය අපොහොසත් වී තිබුණි.

**3.10 පාඩු හා හානි**

**--------------**

2010 ජනවාරි 07 දින අමාත්‍යාංශයේ වාහනයක් අනතුරට ලක් වීමෙන් රු.511,392 ක අලාභයක් සිදු වි තිබුණි. 2015 ජූනි 19 දින වන විටත් එම අලාභය අමාත්‍යාංශය විසින් අයකර ගෙන නොතිබුණි.

**3.11 විසඳා නොතිබුණු විගණන ඡේද**

**--------------------------------**

අමාත්‍යාංශයට අදාලව විගණකාධිපති වාර්තාවල ඇතුළත්ව තිබුණු විගණන ඡේදවලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් නිවැරදි කර නොතිබුණු ඡේදවලට යොමුව පහත දැක්වේ.

| | **යොමුගත විෂයය** | **සභාවේ නිර්දේශය** | **ලේකම්වරයාගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | ------------------- | ---------------------- | ------------------------ |
| (i) | මාලිගාවත්ත මහ ලේකම් කාර්යාල පරිශ්‍රයේ ගොඩනැගිලිවලින් රු.මිලියන 246 ක නිවාස කුලී අය නොවීම. | නිල නිවාස කුලී ඉක්මනින් අයකර ගැනීමටත් නඩත්තුව සඳහා එම ආයතන වෙතම ගොඩනැගිලි භාරදීමටත් කටයුතු කළ යුතුය. | 2013 දෙසැම්බර් මාසය වන විට පැවති හිඟ කුලිය රු.මිලියන 246.6 ක් වී තිබුණු අතර, 2015 ජූලි 15 දින වන විට රු.මිලියන 167.8 ක මුදලක් අමාත්‍යාංශ ලේකම් විසින් නිරවුල් කර තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ii) | අග්‍රහාර රක්ෂණ ක්‍රමය සංශෝධනය කිරීම යටතේ ණය සුරකුම් රක්ෂණාවරණය ඇපයට තබා ණය ලබාගත් නිලධාරියෙකු සේවය හැර ගොස් ඇති විටක හෝ සේවයෙන් පහ කරනු ලැබූ විට රක්ෂණාවරණය යටතේ රක්ෂණ ආවරණය ලබාගත නොහැකි වීම. | ණය පැහැර හරින නිලධාරීන්ට අදාල ණය මුදල අග්‍රහාර රක්ෂණ භාර අරමුදලින් අයකර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට අදාල පාර්ශවයන් සමග සාකච්ඡා කරන ලෙස දෙන ලද නියෝගය | අග්‍රහාර රක්ෂණය සඳහා ඇපයට තබා ගන්නා ලද ණය මුදල්, නිලධාරියෙකු සේවය හැර ගොස් ඇති විටක හෝ සේවයෙන් පහ කරනු ලැබූ විට අග්‍රහාර රක්ෂණ භාර අරමුදලින් අය කර ගැනීමට විධි විධාන ඇතුළත් කරමින් 2015 ජුලි 15 දින වන විට චක්‍රලේඛයක් නිකුත් කිරීම සඳහා සංශෝධිත කෙටුම්පතක් සකස් කර මහා භාණ්ඩාගාරය වෙත යවා තිබුණි |

## 3.12 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 74 | 72 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 18 | 12 | 06 |
| (iii) | ද්විතියික මට්ටම | 552 | 433 | 119 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 234 | 201 | 33 |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | 01 | 01 | - |
| | **එකතුව** | **879** | **719** | **160** |

## 4. ශීර්ෂය 253 - විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

---

### 4.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛණය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/2 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(i) වගන්තිය |

### 4.2 විගණන සාක්ෂි නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුව විසින් සිදු කර තිබුණු එකතුව රු.18,243,792,888 කට අදාල ගනුදෙනු වෙනුවෙන් ආබාධිත හා මියගිය රණවිරුවන්ට හා පොලිස් නිලධාරින්ට අදාල අවුරුදු 55 සම්පූර්ණ වන දිනයන්, විශ්‍රාම වැටුප් අංකය හෝ වැන්දඹු හා අනත්දරු අංකය, විශ්‍රාම වැටුප් ලබා ගන්නා ප්‍රාදේශිය ලේකම් කාර්යාලය ආදී වූ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට වූ බැංකුව මඟින් ගෙවිය යුතු සහ දෙපාර්තමේන්තුව මඟින් ගෙවිය යුතුව තිබූ එකතුව රු. 637,789,591 ක් වූ පාරිතෝෂික මුදල් ගෙවූ බව සනාථ කර ගැනිමට අවශ්‍ය උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.3 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

දෙපාර්තමේන්තුව වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 12 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 35,530,385,660 ක් විය.

**4.4 විසර්ජන ගිණුම**

සමාලෝචිත වර්ෂයේදි විශ්‍රාම පාරිතෝෂික බැංකු ණය පහසුකම් යටතේ ගෙවිමේදි එසේ ලබාගත් ණය සඳහා ගෙවා තිබුණු රු.139,262,676 ක් වූ බැංකු ණය පොලිය 1601 වැය විෂය යටතේ ගිණුම්ගත නොකර එය විශ්‍රාමික පාරිතෝෂික වැය විෂය යටතේ ගිණුම්ගත කර තිබුණි.

**4.5 පොදු තැන්පත් ගිණුම**

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.167,734 ක් වූ තැන්පතු 4 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**4.6 ආදායම් ගිණුම්**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 2 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) **ආදායම් සංකේතය 20.04.01.00 - සමාජ සංරක්ෂණ දායක මුදල් (මධ්‍යම රජය)**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාලව රු.මිලියන 12,000 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 9,362 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 78 ක් වි තිබුණි.

(ii) 2001 ජනවාරි 15 දිනැති අංක 1/2001 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය ප්‍රකාරව සෑම මාසයකම ගිණුම් සාරංශ මඟින් ආදායම් සංකේතයට අදාල ආදායම් ගිණුම්ගත කිරීමත්, ආදායම් ආපසු ගෙවීම් ගිණුම්ගත කළ පසු මාසික ගිණුම් සාරාංශ ඊළඟ මාසයේ 15 දිනට ප්‍රථම විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත එවිය යුතුව තිබුණි. නමුත් ආයතන බොහොමයක් එම විධිවිධාන අනුව වාර්තා ඉදිරිපත් කර නොතිබුණු අතර එම වාර්තා ගෙන්වා ගැනිම සඳහා දෙපාර්තමේන්තුව විසින් විධිමත් පියවරද ගෙන නොතිබුණි.

(iii) මධ්‍යම රජයට අයත් ආයතනයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී සමාජ සංරක්ෂණ දායක මුදල් ලෙස එකතුව රු.9,361,637,260 ක් ලැබී තිබුණි. මාසිකව ලැබී තිබුණු සමාජ සංරක්ෂණ දායක මුදල් ලැබීම්වල මාසික විචලනය රු.31,102,666 ක් වූ ඍණ අගයක සිට රු.242,826,695 ක් වූ ධන අගයක් දක්වා පරාසයක ප්‍රමාණයකින් විචලනයන් සිදු වී තිබුණත්, එම විචලනයන් සම්බන්ධයෙන් බලපෑ කරුණු පිළිබඳව අදාළ පැහැදිලි කිරීම් කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී රු.14,648,483 ක් ආදායමෙන් ආපසු ගෙවා තිබූ අතර එයින් රු.5,189,747 ක් වූ ගෙවීම් තහවුරු කරගැනීම සඳහා අදාල ආයතනවලින් හර නිවේදන ගෙන්වා ගැනීමට දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාණවත් පරිදි කටයුතු කර නොතිබුණි.

(v) ද්විතික පදනම මත මුදාහරින ලද නිලධාරින්ගේ දායක මුදල් ලැබීම් සම්බන්ධ කිසිදු ලේඛනයක් වැන්දඹු හා අනත්දරු කාර්යාලය විසින් පවත්වා නොතිබුණි. හිඟ දායක මුදල් අදාල ආයතනවලින් ගෙන්වා ගැනීමට හෝ ආදායම් ගිණුම්වල හිඟ දායක මුදල් සටහන් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

(vi) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට අදාලව 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා නිලධාරින් 36 දෙනෙකු වැටුප් රහිත නිවාඩු ලබා සිටි නමුත් එම කාලය සඳහා දායක මුදල් ගෙවා නොතිබුණි.

**(ආ) ආදායම් සංකේතය 20.04.02.00 - සමාජ සංරක්ෂණ දායක මුදල් (පළාත් සභා)**

**--------------------------------------------------------------------------------**

මෙම ආදායම් ගිණුම සම්බන්ධයෙන් පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව ආදායම් සංකේතයට ආදාලව රු.මිලියන 7,000 ක ආදායමක් රැස්කිරිමට ඇස්තමේන්තු කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 5,557 ක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 79 ක් වී තිබුණි.

(ii) මුදල් රෙගුලාසි128 (2) (උ) සහ 2002 ජුලි 17 දිනැති අංක 1/2002 දරන රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛය පරිදි දායක මුදල් ලැබිම් විශ්ලේෂණය කළ හැකිවන පරිදි එක් එක් ආයතනයෙන් මාසිකව ලැබුණු දායක මුදල් පිළිබඳ වාර්තා පවත්වා නොතිබුණි.

(iii) 2001 ජනවාරි 15 දිනැති අංක 01/2001 දරන විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගේ චක්‍රලේඛයේ 2.2, 2.3 සහ 2.5 ඡේද ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iv) වැරදීමකින් නියමිත මුදලට වැඩියෙන් ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණු සමාජ සංරක්ෂණ දායක මුදල් ආපසු ගෙවීම සඳහා මුදල් රෙගුලාසි 118(2)(අ) ප්‍රකාරව රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුව තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.939,626 ක් වු සමාජ සංරක්ෂණ දායක මුදල් ආදායමෙන් ආපසු ගෙවීම් කිරිම වෙනුවෙන් වැන්දඹු අනත්දරු කාර්යාලයේ ගණකාධිකාරි හා අධ්‍යක්ෂවරයාගේ සහතික කිරීමෙන් සහ අනුමත කිරීමෙන් සිදුකර තිබුණි. එහෙත් ලැබීම් තහවුරු කරගැනීම සඳහා එම ආයතනවලින් ලැබීම් කුවිතාන්සි ලබාගෙන නොතිබුණි.

(v) ද්විතික පදනම මත මුදාහරින ලද නිලධාරින්ගේ දායක මුදල් ලැබීම් සම්බන්ධ කිසිදු ලේඛනයක් වැන්දඹු හා අනත්දරු කාර්යාලය විසින් නඩත්තු කර නොතිබුණි. හිඟ දායක මුදල් අදාල ආයතනවලින් ගෙන්වා ගැනීමට හෝ ආදායම් ගිණුම්වල හිඟ දායක මුදල් සටහන් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි.

## 4.7 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 25301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,102,312 ක්වූ අතර, එම හිඟහිටි ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 24 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) මුදල් රෙගුලාසි 506(ඇ) ප්‍රකාරව කේවල ණය ශේෂ වර්ගීකරණ සාරාංශයේ 2014 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ ශේෂය පාලන ගිණුමේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂය සමඟ රු. 1,038,118 ක වෙනසක් පැවැතුණත්, එය සසඳා නොතිබුණි.

**(ඇ)** 2014 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අතර රු.4,796 ක වෙනසක් වර්ෂ ගණනාවක සිට පැවැත එමින් තිබුණත්, එය නිවැරදි කිරිමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අපොහොසත් වි තිබුණි.

## 4.8 බේරුම් නොකළ බැරකම්

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) දෙපාර්තමේන්තුවේ 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු. 1,074,122,583 ක් වී තිබුණි.

(ආ) 2014 අප්‍රේල් මාසයේ සිට විශ්‍රාම පාරිතෝෂික ගෙවිමට දෙපාර්තමේන්තුව විසින් බැංකු ණය ලබා ගෙන තිබු අතර, 2014 දෙසැම්බර් 31 දින වන විට එසේ ලබා ගෙන තිබුණු ණය ශේෂය රු.10,317,214,752 ක් වී තිබුණි. එම ණය ශේෂය විසර්ජන ගිණුමේ බැරකම් යටතේ දක්වා නොතිබුණි.

## 4.9 අනුකූල නොවීම්

### නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2 හා 25 වගන්ති | 13,462,288 | විශ්‍රාම පාරිතෝෂික ලබාගැනිමට මනාපය පලකර විශ්‍රාම පාරිතෝෂික ලබාගත් විට පාරිතෝෂික මුදලින් සියයට 60 ක් පමණ රජයට අයවන නමුත්, විශ්‍රාම පාරිතෝෂික ලබාගැනිමට මනාපය පලකර පාරිතෝෂික ලබාගෙන තිබියදී, ශ්‍රේෂ්ඨාධිකරණය සහ අභියාවනාධිකරණයේ විනිසුරුවරුන්ගෙන් එසේ පාරිතෝෂික මුදල් අය කරගෙන නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| **XXIV පරිච්ඡේදයේ 4.2.3 වගන්තිය** | | නිලධාරියා ණය ලබා ගන්නා අවස්ථාවේදී පවතින ණය ශේෂයන් පරිවර්තිත විශ්‍රාම වැටුපෙන් එකවර අයකර ගැනිමට විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාට කැමැත්ත ප්‍රකාශ කර පවරා තිබු නමුත් ඒ පිළිබඳ සැලකිලිමත් නොවී පළාත් සභා නිලධාරින් සම්බන්ධයෙන් අවකරණ ද සමඟ මුළු පාරිතෝෂික මුදලම විශ්‍රාමිකයාගේ |

බැංකු ගිණුමට සෘජුවම බැර කර තිබුණි .

**(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 447 | - | වැය ලෙජරයේ බැරකම් දක්වා නොතිබුණි. |

**(ඈ) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2014 ජුලි 03 දිනැති අංක 7/2014 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය | - | චක්‍රලේඛය ප්‍රකාරව විශ්‍රාම පාරිතෝෂික මුදල් විශ්‍රාමිකයා සේවය කළ ආයතනයේ නිල බැංකු ගිණුමට බැර කළ යුතු වුවත්, නීතිමය ප්‍රතිපාදන නොතිබියදී විශ්‍රාමිකයාගේ බැංකු ගිණුමට සෘජුවම බැර කර තිබුණි. |

### 4.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

**බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීමේ දීර්ඝ ප්‍රමාදයන්**

බැංකු ගිණුම් 01 කට අදාල 2014 දෙසැම්බර් මාසය සඳහා වු බැංකු සැසඳුම් ප්‍රකාශය 2015 අප්‍රේල් 09 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 4.11 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

ස්ලිප් (slip) ක්‍රමය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීමේදී, බැංකු විසින් බැංකු ගිණුම් අංකය හා නියමිත මුදල පමණක් පදනම් කරගෙන විශ්‍රාමිකයාගේ ගිණුමට මුදල් බැර කිරීම, විශ්‍රාම වැටුප් දත්ත පද්ධතියට දත්ත ඇතුළත් කිරිමේ බලතල ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි විශ්‍රාම වැටුප් නිලධාරින් වෙත පාලන ක්‍රමවේදයන් නොමැතිව පවරා තිබිම හා පාලන ගිණුම් සකසමින් ප්‍රමාණවත් පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබිම, යන අභ්‍යන්තර පාලනය දුර්වලතා හේතුවෙන් ව්‍යාජ ලෙස බැංකු ගිණුම් අංක වෙනස්

කර විශ්‍රාම වැටුප් වංචාවන් සිදු කර තිබුණි. 2014 අගෝස්තු 21 දින වන විට අභ්‍යන්තර විගණන අංශය විසින් රු.30,695,737 ක් වූ වංචාවන් 12 ක් අනාවරණය කර තිබූ අතර දෙපාර්තමේන්තුව විසින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර වංචාවන් සිදු කළ නිලධාරීන් සම්බන්ධයෙන් 2015 ජුනි 30 දින වන විටද පරීක්ෂණ කළ බව තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

**4.12 පාඩු හා හානි**

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) විසර්ජන ගිණුමේ ඩීජීඑස්ජ් -7 ප්‍රකාශය මඟින් ඉදිරිපත් කරන ලද පාඩු පිළිබඳ ප්‍රකාශයේ, සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම්වලින් තවදුරටත් අයකර ගැනීමට තිබෙන පාඩු ලෙස රු.188,959,505 ක් සඳහන් කර තිබූ අතර ඊට අදාල සිද්ධි සංඛ්‍යාව ලෙස විශ්‍රාමිකයින් සංඛ්‍යාව සඳහන් නොකර ප්‍රාදේශිය ලේකම් කාර්යාල සංඛ්‍යාව දක්වා තිබුණි.

(ආ) විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවීම් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර ගැනීමට පියවර ගැනීමකින් තොරව, විශ්‍රාමිකයාගෙන් අයකර ගැනීමට පියවර ගෙන තිබුණි. ඒ අනුව වැඩිපුර ගෙවීම් අයකර ගැනීමට පෙර විශ්‍රාමිකයකු හෝ වැන්දඹුව මියගිය විටක, අයකර නොගත් ශේෂය සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. නමුත් එවැනි තත්ත්වයන් පිළිබඳව ප්‍රාදේශිය ලේකම් කාර්යාල මගින් තොරතුරු කැඳවීමකින් තොරව, විසර්ජන ගිණුමේ ඩීජීඑස්ජ්7 (1) පොත්වලින් කපාහැරීම් පිළිබඳ ප්‍රකාශය හිස් වාර්තාවක් ලෙස විසර්ජන ගිණුමේ දක්වා තිබුණි.

(ඇ) පසුගිය වසරේ විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කර තිබුණු හානි හා පාඩු ලැයිස්තුවේ සඳහන් කර තිබුණු 2013 දෙසැම්බර් 31 දිනට වූ වැඩිපුර ගෙවූ විශ්‍රාම වැටුප් ශේෂය සහ සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුම සමඟ ඉදිරිපත් කර තිබුණු 2014 ජනවාරි 01 දිනට දක්වා තිබුණු ශේෂ අතර රු.8,078,943 ක වෙනස සම්බන්ධයෙන් හේතු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**4.13 කළමනාකරණ දුර්වලතා**

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

**(අ) දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ගොඩනැගිලි කුලියට ලබාදීම පරීක්ෂාව**

-----------------------------------------------------------------

කුලී පදනම මත ගොඩනැගිලි ලබාගෙන තිබුණු ආයතන 6 ක් වෙතින් 2014 වර්ෂය සඳහා රු.18,456,400 ක්ද, 2014 වර්ෂයට පෙර වර්ෂ වෙනුවෙන් ආයතන 8 කින්

රු.61,407,189 ක් වශයෙන් එකතුව රු.79,863,589 ක් 2014 දෙසැම්බර් 31 දින වන විට හිඟහිටිව පැවැතුණි. එම හිඟකුලි අයකර ගැනිමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

**(ආ) බැංකු ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සඳහා බිම් කුලියක් අයකර නොගැනිම**

-----------------------------------------------------------------------

රජයේ බැංකුවක ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍රය සවිකිරිම සඳහා වර්ෂය ආරම්භයේ සිටම ලබා දී තිබූ බිම් ප්‍රමාණය වෙනුවෙන් කිසිදු කුලියක් දෙපාර්තමේන්තුව විසින් අදාළ බැංකුව වෙතින් අය කර ගැනිමට කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ දේපලක කාර්යාල පවත්වා ඒ සඳහා කුලියක් ලබා ගැනිම**

-------------------------------------------------------------------

මාලිගාවත්ත බටහිර, මාලිගාවත්ත නැගෙනහිර සහ පංචිකාවත්ත යන ග්‍රාම නිලධාරි වසම්වල ග්‍රාම නිලධාරින් තිදෙනා විසින් මාලිගාවත්ත මහා ලේකම් කාර්යාල පරිශ්‍රයෙන් වර්ග අඩි 578 ක පමණ ඉඩකඩ ප්‍රමාණයක් කුලී ගෙවීමකින් තොරව පරිහරණය කර තිබුණි. කොළඹ ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සමඟ මේ සම්බන්ධව ලිපි හුවමාරු කිරිමකින් එම භූමිය ලබාදිම් සිදුකර ඇති බවට කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොවුණි. එමෙන්ම රජයේ දේපලක කාර්යාලය පවත්වාගෙන යමින් එම නිලධාරින් වැටුප සමඟ කාර්යාල දිමනාව ලෙස රු. 99,750 ක් 2010 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ලබාගෙන තිබුණි.

**(ඇ) ආයුර්වේද සංස්ථා හෙළ ඔසුහලක් ස්ථාපිත කිරිම**

---------------------------------------------------

ආයුර්වේද සංස්ථා හෙළ ඔසුසැලක් ස්ථාපිත කිරිම සඳහා රු.20,000 ක මාසික කුලියකට වර්ග අඩි 325 ක ප්‍රමාණයක් ගොඩනැගිල්ලක් 2014 නොවැම්බර් 17 දින ගිවිසුම් ප්‍රකාරව ලබාදි තිබුණි. විගණන පරික්ෂාව සිදු කළ දිනය වන විටත්, එහි ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරිම හෝ අදාළ කුලි ලබා ගැනිමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි.

**(ඉ) හිඟ බදු හා කුලී අයකර නොගැනිම**

--------------------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) මාලිගාවත්ත මහ ලේකම් කාර්යාලීය පරිශ්‍රය තුළ පිහිටුවා තිබුණු තැපැල් කාර්යාලය වෙනුවෙන් 2013 අප්‍රේල් 24 දින වන විට ගෙවිය යුතු හිඟ බදු කුලිය රු. 8,950,005 ක් වී තිබුණි. මෙ සම්බන්ධයෙන් තැපැල් සේවා අමාත්‍යාංශයේ 2014 ජුනි 17 දිනැති අංක MSP/DEV/33206 දරන ලිපිය මගින් මෙම හිඟ බදු

කුලි කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීමට නියමිත බව දන්වා තිබුණි. 2015 ජනවාරි වන විටත් එම හිඟහිටි බදු මුදල් අයකර ගෙන හෝ කපාහැර හෝ නොතිබුණි. 1996 ජනවාරි 01 දින උක්ත භූමිය තැපැල් දෙපාර්තමේන්තුව වෙත තැපැල් කාර්යාලයක් පවත්වා ගැනීම පිණිස ලබාදී තිබූ නමුත් ගිවිසුමකට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ii) 2014 ජනවාරි 01 දින සිට පවත්වාගෙන යන වර්ග අඩි 1777 ප්‍රමාණයක ආපන ශාලාව සඳහා අදාල ගිවිසුම ප්‍රකාරව මාසික කුලිය රු.50,900 ක් වූ අතර ඒ අනුව මාස 12 ක කාලය සඳහා රු.319,900 ක්වූ හිඟ කුලියද සහ ඊට අදාල දඩ මුදල්ද 2015 පෙබරවාරි 12 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

(iii) ගිවිසුමෙහි 3 ඡේදයේ සඳහන් පරිදි කුලි නොගෙවන අවස්ථාවලදී අනුගමනය කළ යුතු ක්‍රියාපිළිවෙල අනුව දඩ මුදල් අය කිරීම හා කුලි මුදල් ඇප මුදලින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**(ඊ) විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය අනුව වියදම තහවුරු නොවීම**

විශ්‍රාම වැටුප් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා මුළු පුනරාවර්තන වියදමින් සියයට 80.5 ක් වැය කර තිබුණි. 253-1-2-2-1502(21) හා 253-1-2-1-1502(11) යන වැය විෂයයන් යටතේ එකතුව රු. 135,589,336,224 ක් වැය කර තිබුණත්, එම මුළු වියදමේ නිවැරදිතාවය විශ්‍රාම වැටුප් දත්ත පද්ධතිය මගින් සනාථ කර නොතිබුණි.

**(උ) ඒකාබද්ධ පාලන ගිණුමක් පිළියෙල නොකිරීම**

2011 ජනවාරි 30 දිනැති අංක 01/2011 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා 2014 අප්‍රේල් 07 දිනැති අංක 01/2011 (සංශෝධිත 1) දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් නව විශ්‍රාමිකයින් එකතුවීම, මිය යාම හා ලිපිගොනු මාරුකිරීම යනාදී ගැලපීම්වලට අදාලව මාසිකව පාලන ගිණුමක් සැකසීමෙන් පසුව මාසික විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා අග්‍රිම ඉල්ලුම් කළ යුතු වුවත්, එසේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඉදිරිපත් කරනු ලබන පාලන ගිණුම් ඒකාබද්ධ කර දෙපාර්තමේන්තුවේ ඒකාබද්ධ පාලන ගිණුමක් පිළියෙල කර නොතිබුණි.

**(ඖ) නාවික හමුදාවේ නාවිකයින් සඳහා වැටුප් හා දීමනා ගෙවීම සඳහා ප්‍රතිපාදන ලබාදීම**

---

යුද්ධයේදී මිය ගිය හා අබාධිත තත්ත්වයට පත් නාවික හමුදාවේ නිලධාරීන්ට නාවික හමුදා මුලස්ථානයෙන් වැටුප් හා දිමනා ගෙවා තිබුණි. එම නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) යුද්ධයේදී මිය ගිය හා ආබාධිත වූ නාවික නිලධාරීන් වෙත ඔවුන්ගේ වයස අවුරුදු 55 ක් වන විශ්‍රාම යා යුතු දිනය දක්වා නාවික හමුදාව විසින් වැටුප් හා දීමනා ගෙවිය යුතු විය. ඒ අනුව ඔහුනට හිමි ජීවන වියදම් දීමනාව නාවික හමුදාව විසින් ගෙවනු ලබන වැටුප් හා වේතනවල ඇතුළත්ව තිබුණි. විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඔවුන් මිය ගිය හෝ ආබාධිත තත්ත්වයට පත්වූ දිනයේ සිට විශ්‍රාම වැටුප් ගෙවිය යුතුය. නමුත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවනු ලබන විශ්‍රාම වැටුපෙහිද ජීවන වියදම් දීමනාවේ කොටසක් ඇතුළත්ව ගෙවීම් කර තිබුණි. ඒ අනුව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණු ජීවන වියදම් දීමනාව වැඩිපුර ගෙවූ මුදලක් වශයෙන් විගණනයේදී නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සිදු කළ විගණන නියැදි පරික්ෂාවට අනුව ආබාධිත වූ නාවිකයන් 36 දෙනෙකු වෙත කර තිබුණු විශ්‍රාම වැටුප් ගෙවීම් පරික්ෂාවේදී 2008 වර්ෂයේ සිට 2014 දෙසැම්බර් දක්වා රු. 4,391 ,612 ක් ජීවන වියදම් වශයෙන් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) ක්‍රියාත්විත රාජකාරියේ යෙදි සිටියදී අබාධිත වූ සහ මියගිය හා අතුරුදහන් වූ නාවික නිලධාරින් හා ඔවුන්ගේ යැපෙන්නන් විදේශ ගතවීමට පෙර නාවික හමුදා අංශයට දැණුම් දිම හා විදේශ ගත විමෙන් පසුව ජීවිත සහතිකය නියමිත දිනයට ඉදිරිපත් නොකරනු ලබන අවස්ථා තිබුණි.

(iii) ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය සියයට 50 ට වැඩි තත්ත්වය යටතේ වැටුප් හා දීමනා සහිතව විශ්‍රාම ගැන්විය හැකි වුවත්, නාවික හමුදාවේ 187 දෙනෙකුගේ ඉපයීමේ ශක්තිය හීනවීමේ ප්‍රතිශතය සියයට 50 ට අඩු තත්ත්වයකදී වැටුප් හා දීමනා සහිතව විශ්‍රාම ගන්වා තිබූ නමුත් එම නිලධාරින් සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ සියළු ප්‍රතිලාභ ගෙවනු ලැබුවද දෙපාර්තමේන්තුව එවැනි පරස්පර තත්ත්වයන් හඳුනා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

**(එ) විශ්‍රාම පාරිතෝෂික බැංකු ක්‍රමය මගින් ගෙවීම**

2014 අප්‍රේල් 09 දින වන විට 2013 හා 2014 වර්ෂවලට අදාලව ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික අයදුම්පත් 17,029 ක් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණි. එම අයදුම්පත් සම්බන්ධයන් විධිමත් පරිදි තොරතුරු ලබා ගැනිමෙන් තොරව බැංකු ක්‍රමය උපයෝගී කරගෙන විශ්‍රාමිකයන් වෙත පාරිතෝෂික එම විශ්‍රාමිකයන්ගේ බැංකු ගිණුම්වලට සෘජුව බැර කර තිබුණි. මේ නිසා පහත සඳහන් අඩුපාඩුව සිදු වී තිබුණි.

විශ්‍රාම ගන්වා සිටි නිලධාරීන්ගෙන් රජයට අයවිය යුතු මුදල් විශ්‍රාමික පාරිතෝෂිකයෙන් අවකරණ කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවකදී අවස්ථා 17 කදී විශ්‍රාමික පාර්තෝෂිකයෙන් අයකර ගත යුතුව තිබුණු එකතුව රු.1,741,175 ක් අයකරගෙන නොතිබුණි.

**4.15 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 23 | 18 | 5 | - |
| (ii) | තෘතියික මට්ටම | 11 | 1 | 10 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,076 | 874 | 202 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 75 | 50 | 25 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 13 | - | 13 |
| | **එකතුව** | **1,185** | **956** | **242** | **13** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

අනියම් පදනමින් නිලධාරින් දෙදෙනෙකු සහ තාවකාලික පදනමින් නිලධාරීන් දෙදෙනෙකු වශයෙන් නිලධාරින් 04 දෙනෙකු බඳවා ගෙන තිබුණි. රියදුරු තනතුරු 4 ක්ද, තාවකාලික පදනමින් බඳවාගෙන තිබුණු කාර්යාල කාර්ය සහායක තනතුරු 6 ක්ද, අනියම් පදනමින් බඳවාගෙන තිබු උද්‍යාන කම්කරු තනතුරු 3 ක්ද වශයෙන් සේවකයන් 13 ක් අතිරික්තව පැවැතුණි.

**(ආ) වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත්**

දෙපාර්තමේන්තුව විසින් වෙනත් පාර්ශවයන්ගෙන් ලබාගත් මානව සම්පත් පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි අනාවරණය විය.

| සේවක වර්ගය | සංඛ්‍යාව | වෙනත් පාර්ශවය | කාලපරිච්ඡේදය |
|---|---|---|---|
| පොලිස් කාන්තා සැරයන් | 01 | පොලිස් දෙපාර්තමේන්තුව | 2010-2014 |
| පොලිස් කාන්තා සැරයන් | 01 | පොලිස් දෙපාර්තමේන්තුව | 2012-2014 |

## 5 ශීර්ෂ 254 - රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### 5.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ |
|---|---|---|
| බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 | පවත්වා නොතිබුණි. |
| නොතාරිස් නාමලේඛනය | නොතාරිස් අත්පොතේ 07 වන වගන්තිය | යාවත්කාලීන කර නොතිබුණි. |
| ලියාපදිංචි ගාස්තු ආදායම් ගිණුමට අදාල පොත්පත් | මුදල් රෙගුලාසි 128(2)(ඌ) | පවත්වා නොතිබුණි. |

### 5.2 විසර්ජන ගිණුම

#### 5.2.1 අයවැය විචලනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 24 ක් සඳහා අධිප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ක සිට සියයට 76 ක් දක්වා පරාසයක වු අතර එම ඉතිරිවීම් සඳහා දක්වා තිබු හේතු පිලිගත නොහැකි විය.

(ආ) වැය විෂයයන් 03 කට අදාල රු.12,000,000 ක් වු සම්පූර්ණ ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයයන් වලට මාරුකර තිබුණි.

(ඇ) මුලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් මුදල් රෙගුලාසි 66 විධිවිධාන ප්‍රකාරව වෙනත් වැය විෂයන් වෙත ප්‍රතිපාදන මාරු කිරිමෙන් පසුවද සියයට 10 ඉක්මවා රු.5,525,584 ක් වූ ප්‍රතිපාදන ඉතිරි වු අවස්ථා 6 ක් නිරික්ෂණය විය.

(ඈ) මුලික ඇස්තමේන්තුව මගින් සළසා ඇති ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 මාරුකිරීම් මඟින් අතිරේක ප්‍රතිපාදන සළසා ගත් පසුව වැය විෂයයන් 03 ක සියයට 10 ඉක්මවා රු.3,225,986 ක් වූ ඉතිරිවීම් නිරික්ෂණය විය.

**5.3 ආදායම් ගිණුම්**

**-----------------**

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරි වශයෙන් ආදායම් සංකේත 02 ක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරිම, ආදායම් රැස්කිරිම, ගිණුම්ගත කිරිම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්ය භාරය පැවැරි තිබුණි. එම ආදායම් සංකේතවලට අදාලව සිදුකළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

**(අ) 10-03-07-02 දරන ආදායම් සංකේතය - ලියාපදිංචි කිරිමේ ගාස්තු**

**-----------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව රු.මිලියන 1,625 ක ආදායම් ඇස්තමේන්තු කර තිබු අතර එම ඇස්තමේන්තුව රු.මිලියන 1,200 ක් දක්වා සංශෝධනය කර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 1,106 ක ආදායම් රැස්කර තිබුණි. එසේ රැස්කළ ආදායම සංශෝධිත ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 92 ක් වි තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ අවසානයට ලියාපදිංචි ගාස්තු ආදායම් එකතුව රු.මිලියන 6.52 ක් හිඟහිට තිබුණු අතර, එම හිඟ හිටි ආදායම වර්ෂ 1 ක සිට වර්ෂ 4 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟ හිටි ආදායම් සමාලෝචිත

වර්ෂය අවසනා වන විටත් අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 128(2) ප්‍රකාරව අර්ධ වාර්ෂික හිඟ ආදායම් පිළිබඳ වාර්තා පිළියෙල කර නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදි ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල 47 කින් කාර්යාල 32 ක පමණක් හිඟ ආදායම් වාර්තා ඉදිරිපත් කර තිබූ අතර එම වාර්තාවල අයවිමට ඇති සමස්ථ මුදල සහ රු.5,000 කට අඩු හිග ආදායම් වෙන වෙනම හදුනාගත හැකි ආකාරයෙන් වාර්තා කර නොතිබුණි.

(v) මුදල් රෙගුලාසි 128(1)(ආ) ප්‍රකාරව රජයට ලැබිය යුතු ගාස්තු අප්‍රමාදව හා සම්පූර්ණයෙන්ම එකතු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(vi) ලියාපදිංචි ගාස්තු ආදායම් ගිණුමේ දක්වා තිබුණු හිඟ ගාස්තු අයකර ගැනීම සම්බන්ධයෙන් එම කාර්යය පැවැරි ඇති නිලධාරින් විසින් මුදල් රෙගුලාසි 128(1)(ඌ) හා 128(2)(ඉ) විධිවිධානයන් ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(vii) 2014 වර්ෂය තුළ රු. මිලියන 31.66 ක මුදලක් ආදායමෙන් ආපසු ගෙවා තිබු නමුත් ඉන් රු. මිලියන 0.13 ක් ගෙවිම සදහා මුදල් රෙගුලාසි 118(2)(ආ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(viii) 2014 වර්ෂයේදි ආදායම් ගිණුමේ රු.මිලියන 594.59 ක වු ලැබිම්ද, රු.මිලියන 31.53 ක ගෙවිම්ද දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල ආදායම් රැස්කිරිම් හා ආපසු ගෙවිම් ලෙස දක්වා තිබුණත්, එම ලැබිම හා ගෙවිම් සනාථ කර ගැනිම සඳහා දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවලින් තොරතුරු විධිමත්ව වාර්තා කර ගැනිමේ ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

(ix) මුදල් රෙගුලාසි 128(2)(උ) ප්‍රකාරව, ලියාපදිංචි ගාස්තු ආදායම් රැස්කිරිම සඳහා විධිමත් පරිදි ලේඛන යාවත්කාලින කර නොතිබුණි.

(x) 2012 දෙසැම්බර් 31 දිනැති අංක 9/2012 දරන රෙජිස්ට්‍රාර් ජනරාල්ගේ චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රාදේශිය ලේකම් කාර්යාල 133 ක් විසින් විවාහ, උපත් හා මරණ සහතික පිටපත් නිකුත් කිරීම, ප්‍රකාශ පත්‍ර සහ පරිවර්තන වෙනුවෙන් වු අයකිරිම් හා විවාහ

ලියාපදිංචි කිරිම් වෙනුවෙන් අයකරන ගාස්තු පිළිබඳව වර්ගීකරන සාරාංශ වාර්තා 2014 ජනවාරි සිට දෙසැම්බර් දක්වා කාලය සඳහා පිළියෙල කර නොතිබුණි.

(xi) මුදල් රෙගුලාසි 177 (4) විධිවිධාන ප්‍රකාරව ආදායම් රැස් කිරිමට අදාළව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල හා කලාප කාර්යාල 54 න් 27 ක් විසින් 2014 දෙසැම්බර් මාසය වෙනුවෙන් පිළියෙල කළ යුතු " එච්" අක්ෂර ගිණුම් 2015 අප්‍රේල් 01 දින වන විටත් පිළියෙල කර කාර්යාලය වෙත එවා නොතිබුණි.

**(ආ) 10-03-08-00 දරන ආදායම් සංකේතය - නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරිමේ ගාස්තු**

---

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(i) සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අනුව නොතාරිස්වරුන්ට වාර්ෂික මහාධිකරණ සහතික නිකුත් කිරීමේ ගාස්තු වශයෙන් රු.මිලියන 20.00 ක් දක්වා තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විට ඉන් රු.මිලියන 17.59 ක් රැස්කර තිබුණි. ඒ අනුව සංශෝධිත ඇස්තමේන්තුව අනුව රු.මිලියන 2.41 ක ආදායමක් රැස්කිරිමට අපොහොසත් වි තිබුණි.

(ii) 2014 දෙසැම්බර් 30 දිනැති අංක 241/2014 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 4.3 ඡේදය ප්‍රකාරව වෙනත් අමාත්‍යංශ විසින් ඉදිරිපත් කරනු ලබන ගිණුම් සාරාංශ මඟින් ආදායම් ගිණුමට බැර කර තිබු රු.මිලියන 15.58 ක ආදායම් සඳහා කිසිදු බැර නිවේදනයක් දෙපාර්තමේන්තුවේ නොතිබුණි.

(iii) අධිකරණ අමාත්‍යංශය විසින් මෙම ආදායම් සංකේතයට අදාළව රු.මිලියන 15.58 ක ආදායම් රැස්කර තිබුණි. නමුත් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ ආදායම් සංකේතය සඳහා ඉන් රු. 666,990 ක් වාර්තා කර තිබුණි. ඒ අනුව රු.මිලියන 14.92 ක ආදායම් මෙම ආදායම් සංකේතය යටතේ ගිණුම්ගත කර නොතිබුණි.

(iv) දෙපාර්තමේන්තුව විසින් නොතාරිස්වරුන් සම්බන්ධයෙන් පවත්වා ගනු ලබන නොතාරිස් නාම ලේඛනය සඳහා මියයාම්, ඇතුළත්වීම් හා ඉවත්වීම් යනාදි වෙනස්වීම් ගලපා යාවත්කාලීන කර නොතිබුණි.

**5.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 25401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරික්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.2,849,702 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ මාස 6 සිට වර්ෂ 28 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත්වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට විශ්‍රාම ගිය නිලධාරින් 138 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.288,745 ක ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. ඉන් එකතුව රු.198,343 ක ණය ශේෂ 1986 වර්ෂයේ සිට 1996 වර්ෂය දක්වා කාලයක සිට පැවත එමින් තිබුණි.

(ඇ) 1990 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වන විට මියගිය නිලධාරින් 13 දෙනෙකුගෙන් අයවිය යුතු රු.116,586 ක ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. 1991 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලයක සිට පැවැත එන වැඩ තහනම් කළ නිලධාරින් 15 දෙනෙකුගෙන් අයවිය යුතු රු.630,451 ක ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. 1990 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලයක සිට පැවැත එන සේවය හැරගිය නිලධාරින් 24 දෙනෙකුගෙන් අයවිය යුතු රු.437,394 ක ණය ශේෂයන් අයකරගෙන නොතිබුණි.

**5.5 බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තු විසින් 2014 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.මිලියන 15.80 ක් පැවතුණි.

**5.6 අනුකූල නොවීම්**

**භාණ්ඩ හා සේවා සැපයීම රහිතව මුදල් නිදහස් කිරිම.**

විදුලි ජනක යන්ත්‍රයක් මිලදි ගැනිම සඳහා 2013 දෙසැම්බර් 31 දින ලංකා විදුලි බල මණ්ඩලය වෙත රු.මිලියන 8.52 ක් ගෙවා තිබුණි. 2013 දෙසැම්බර් 09 දින, ලංකා විදුලි බල මණ්ඩලය

විසින් ඉදිරිපත් කර තිබු ඇස්තමේන්තුව අනුව ගෙවීම් කර මාස 12 ක් ඇතුළත සැපයීම් සිදු කළ යුතු වුවත්, 2015 මාර්තු 17 දින වන විටත් විදුලි ජනක යන්ත්‍රය සපයා ගැනිමට කටයුතු කර නොතිබුණි.

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4(1) මාර්ගෝපදේශය ප්‍රකාරව කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක් වන රු.මිලියන 1.70 ක අත්තිකාරම් ගෙවිය හැකි වුවත්, එම සීමාව ඉක්මවා රු.මිලියන 8.52 ක අත්තිකාරම් ගෙවා තිබුණි.

## 5.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 43 | 10 | 33 | - |
| (ii) | තෘතියික මට්ටම | 49 | 56 | - | 7 |
| (iii) | ද්විතියික මට්ටම | 2,162 | 1,702 | 460 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 462 | 408 | 54 | - |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | **එකතුව** | **2,716** | **2,177** | **547** | **08** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබාගැනිමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.